# අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මගින් වර්ෂ 1998 දී හඳුන්වා දෙන ලද පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ යටතේ 6 - 11 ශ්‍රේණි වල පන්තිකාමරය තුළ ඇගයීම් ක්‍රියාත්මක කරන ස්වරූපය සොයා බැලීම පිණිස කරන විමර්ශනාත්මක අධ්‍යයනයක්

(කුරුණෑගල දිස්ත්‍රික්කය ඇසුරෙන් )

කොළඹ විශ්ව විද්‍යාලයේ
අධ්‍යාපන දර්ශනපති උපාධි පරීක්ෂණය සඳහා
ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ නිබන්ධනය
**M.phil 2002 / 2004**

UCLIB
539969

අධ්‍යාපන පීඨය,
කොළඹ විශ්ව විද්‍යාලය.

කුමුදිනී චන්ද්‍රිකා හෙට්ටිආරච්චි ,
විද්‍යාවේදී (දෙවන පෙළ පහළ) -1985
පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (විශිෂ්ට සම්මාන) -1991
අධ්‍යාපනපති -1997

2005 මැයි

## සාරාංශය

ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතියෙහි ගුණාත්මක සංවර්ධනය උදෙසා , ඉගැන්වීම , ඉගෙනීම හා ඇගයීම වශයෙන් ක්‍රියාත්මක වූ රේඛීය ක්‍රියාවලිය චක්‍රීය ක්‍රියාවලියක් බවට පත්කරමින් ගුරු සිසු සංවර්ධනය තුළින් නිපුණතා පිරි ශිෂ්‍ය පිරිසක් පාසලින් බිහිකිරීමට 1998 වර්ෂයේ සිට පන්තිකාමරයට හඳුන්වා දී තිබෙන පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ ශ්‍රී ලංකාවේ පාසල් වලට වැදගත් කාර්යභාරයක් ඉටුකළ හැකි වැඩ පිළිවෙළකි. මෙම වැඩසටහන පන්තිකාමරය තුළ ක්‍රියාත්මක කිරීමේ දී සැබෑ ලෙසම පන්තිකාමරය තුළ ඇගයීම් සිදුවන ස්වරූපය පිළිබඳ සොයා බැලීම සිදුකළ මෙම පර්යේෂණ අධ්‍යයනයේ දී පහත සඳහන් අරමුණු ඉටු කර ගැනීමට උත්සාහ දරා ඇත.

1. පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළේ අරමුණු හා ස්වභාවය හඳුනාගැනීම.
2. පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ යටතේ 6 - 11 ශ්‍රේණි වලට උගන්වන ගුරුවරුන් භාවිත කරන ඇගයීම් ක්‍රම සහ ඇගයීම් භාවිත කරන ස්වරූපය සොයා බැලීම.
3. පන්තිකාමරය තුළ ඇගයීම් ක්‍රියාත්මක වීමේ දී පාසල් වර්ග අනුව යම් වෙනස්කම් පවතී ද යන්න සොයා බැලීම.
4. පන්තිකාමර ඇගයීම් ක්‍රියාවලිය තුළ ගුරුවරුන්ට මුහුණ දීමට සිදුවන බාධක හා ගැටලු අධ්‍යයනය කිරීම.
5. පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ පිළිබඳ ගුරුවරුන්ගේ හා විදුහල්පතිවරුන්ගේ අදහස් හා ආකල්ප විමසීම.
6. පන්තිකාමර ඇගයීම් පිළිබඳව සිසු ආකල්ප හා අදාළ තොරතුරු විමසීම.
7. ඇගයීම් වැඩපිළිවෙළ තවදුරටත් දියුණු කිරීම සඳහා අවශ්‍ය වන යෝජනා හා අදහස් ඉදිරිපත් කිරීම.

මේ සඳහා පළමුවෙන්ම හැඳින්වීම මගින් අධ්‍යයන ගැටලුව සාකච්ඡා කර ඇති අතර ගැටලුව සඳහා වූ පසුබිම ද කෙටියෙන් ඉදිරිපත් කර තිබේ. අධ්‍යයනයේ වැදගත්කම හා අදාළත්වය පිළිබඳ අදහස් ඉදිරිපත් කර අධ්‍යයනයේ දී පිහිටුවා ගන්නා ලද සීමා දක්වමින් පළමුවන පරිච්ඡේදය අවසන් කර ඇති අතර දෙවන පරිච්ඡේදයේ පළමුවන කොටස මගින් ශ්‍රී

ලංකාවේ පන්තිකාමරය තුළ පළමුවන වරට සම්භවන ඇගයීම ක්‍රියාත්මක කළ අඛණ්ඩ ඇගයීම් වැඩසටහන පිළිබඳව හා වර්තමාන පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ පිළිබඳ විස්තරාත්මක හා සංසන්දනාත්මක ඉදිරිපත් කිරීමක් සිදු කර තිබේ. දෙවන පරිච්ඡේදයේ දෙවන කොටස මගින් විදේශ රටවල් කිහිපයක් පාසල (පන්තිකාමරය ) පදනම් වූ ඇගයීම සිදුකරන ආකාරය සාකච්ඡා කර ඇති අතර ශ්‍රී ලංකාව එම රටවල් හා සැසඳීමේ දී කුමන තැනක සිටී ද යන්න පිළිබඳව අදහස් දක්වා ඇත. තුන්වන පරිච්ඡේදයේ දී මෙම අධ්‍යයනයට අදළ සාහිත්‍ය විමර්ශන තොරතුරු ඉදිරිපත් කරමින් පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ තුළ පවතින විවිධ සංකල්ප පිළිබඳ තොරතුරු අනාවරණය කර ගැනීමක් සිදුකර ඇත . තවද මෙම ඇගයීම් වැඩපිළිවෙළ හා සැසඳෙන පර්යේෂණ තොරතුරු ද ඉදිරිපත් කර තිබේ.මෙහිදී විශේෂයෙන් දැනට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක නොවන 6 -11 ශ්‍රේණි සඳහා භාවිත කළ හැකි ඇගයීම් ක්‍රමෝපායන් හතරක් ඉදිරිපත් කර තිබෙන අතර උප ග්‍රන්ථය 1 මගින් ඒවා ඉදිරිපත් කර තිබේ.

ඉන්පසුව අධ්‍යයන ක්‍රමවේදය ඉදිරිපත් කරන හතරවන පරිච්ඡේදය මගින් විස්තරාත්මක පර්යේෂණ යටතේ සමීක්ෂණ පර්යේෂණයක් වශයෙන් එහි මූලික සැලැස්ම ඉදිරිපත් කර ඇති අතර අධ්‍යයනයේ අරමුණු හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් පැහැදිළිව දක්වා ඇත . යොදගත් නියැදිය වන අධ්‍යාපන කලාප හයෙන් තෝරා ගත් 1AB, 1C හා 2 වර්ගයේ පාසල් 78 ක් , එම පාසල් වලින් ගුරුවරුන් 78 ක නියැදියක් විදුහල්පතිවරුන් 48 ක් හා 9 ශ්‍රේණියෙන් සිසුන් 156 ක් හා 11 ශ්‍රේණියේ සිසුන් 156 ක් යන නියැදි පිලිබඳ විස්තර ද එයින් ප්‍රතිචාර දක්වා ඇති ප්‍රමාණ ද ඉදිරිපත් කර තිබේ. දත්ත ලබා ගැනීම සඳහා යොද ගන්නා ලද ප්‍රශ්නාවලි, නිරීක්ෂණ ෂෙඩ්‍යුල , අවිධිමත් සම්මුඛ සාකච්ඡා හා අවිධිමත් වාර්තා පිළිබඳව ද විස්තර ඉදිරිපත් කර ඇත. පර්යේෂණය මෙහෙයවූ ආකාරය ද විස්තරාත්මකව ඉදිරිපත් කර ඇති අතර දත්ත විශ්ලේෂණය කරන ලද ආකාරය, පර්යේෂණය දියත් කිරීමේ දී මතුවූ බාධක හා සීමා ද ඉදිරිපත් කර තිබේ.

නියැදි ඇසුරින් ලබාගත් සියලුම දත්ත ප්‍රතිශතක වගු හා ප්‍රස්තාර මගින් විස්තරාත්මක විශ්ලේෂණයක් සිදුකරමින් ද ආකල්ප පරීක්ෂා කිරීම සඳහා කයි වර්ග පරීක්ෂාව (Chi - square Test) හා විචලතා විශ්ලේෂණය (Analysis of variance) යටතේ ඒක සාධක විචලතා විශ්ලේෂණය

(one - way ANOVA) සිදුකරමින් ද දත්ත විශ්ලේෂණයට ලක්කිරීම අධ්‍යයනයේ අරමුණු යටතේ සිදුකර ඇත්තේ පස්වන පරිච්ඡේදය මගිනි. එහිදීම දත්ත අර්ථකථනය ද සිදුකර ඇත .හයවන පරිච්ඡේදය මගින් අදාළ නිගමන ද ඒ අනුව ක්‍රියාත්මක කළ යුතු යෝජනා ද ඉදිරිපත් කර තිබෙන අතර අභ්‍යන්තර හා බාහිර ඇගයීම් සඳහා එක් එක් විෂය සුදුසු පරිදි කොටස් කර ඉදිරිපත් කර නියමිත ඇගයීම් සිදු කිරීම , ඇගයීම් වාර්තාකරණය සඳහා සරල මෙන්ම ඵලදායී ක්‍රම භාවිතය, සුදුසු පරිදි ප්‍රයෝගික මට්ටමින් විෂයමාලා සංශෝධනයක් ඇති කිරීම වැනි ජාතික මට්ටමේ යෝජනා ද පාසල තුළම ගුරුවරුන් සඳහා පුහුණු හා ප්‍රතිපෝෂණ අවස්ථා ලබා දීම, ඇගයීම් සම්බන්ධව සිසුන් හා දෙමව්පියන් පුළුල් ලෙස දැනුවත් කිරීම , ගුරුවරුන් ඇගයීම් සඳහා වැඩි නැඹුරුවක් දක්වන්නේ ලිඛිත පරීක්ෂණ සඳහා හෙයින් මෙම අධ්‍යයනය මගින් යෝජිත විධිමත් නව ඇගයීම් ක්‍රම භාවිතයෙන් ශිෂ්‍ය කුසලතා සංවර්ධනය කිරීම , පාසල තුළ ගුරුවරුන්ට සැහැල්ලු මානසිකත්වයෙන් කටයුතු කළ හැකි වන පරිදි පාසල් නියාමන මණ්ඩල ක්‍රියාත්මක වීම වැනි පාසල් මට්ටමේ යෝජනා ද ඉදිරිපත් කර තිබේ.

## Summary

The introduction of SBA into the Sri Lankan School system in 1998 has paved the way for the school to produce a set of teachers and students full of competencies, giving effect to the interlinked process of teaching, learning, and evaluation for the qualitative development of the school system in Sri Lanka.

This research study which is executed to look into the all aspects of SBA at the level of its implementation in the classroom, has tried out to achieve the following objectives:

1. To identify nature and the objectives of the SBA programme
2. To examine the tools and the nature of assessment the teachers of Grades from 6 to 11 use under the SBA.
3. To examine whether there is any discrimination of the quality of assessment depending on the Grade/s of school/s.
4. To study the problems and difficulties the teachers have to under go in the practice of SBA in the Classroom.
5. To inquire into the views and attitudes of the Teachers and Principals about the SBA programme.
6. To inquire into the views and attitudes of the students about the SBA at the Classroom level.
7. To present views and suggestions to strengthen further the process of assessment.

The problem of study is firstly discussed in the introduction and then its background in short. The submission of the views about the relevance and the importance of the study is given in the first chapter setting its limitations. In the first part of the second chapter, it. deals with the continuous assessment which sets the formative assessment in the classroom and the present SBA descriptively and comparatively. There is a discussion in the second part of the second chapter about the contrivance of the SBA at the classroom level in

some foreign countries, and also about the place Sri Lanka occupies among them related to the SBA.

The third chapter of the study deals with the informative literature related to this study and the information about the various concepts of SBA. The assessment tools which are not used in Sri Lanka but could probably be made use of in Grades 6 to 11 are given here. They are presented in the appendix 1.

The methodology of study is given in the fourth chapter. It, deals with the basic plans of study as a survey research under the descriptive research, and it provides clearly the objectives of the study and the activities connected. The sample in use consists of 78 schools of such grades as I AB, I C and 2, 78 teachers, 48 Principals and 156 students from Grade 9, 156 students from Grade 11, all these are given in detail with numbers who responded. All sources of obtaining data such as questionnaires, observation schedules, informal interviews, and informal reports are also given in this chapter. Furthermore, how the research was conducted, the way the data are analyzed, the problems and limitation are also included here with descriptions.

All data presented here in related to the sample are being analyzed through the percentage,charts and diagrams; the Attitudes being examined with the chi-square test and one-way ANOVA test. all data are analyzed according to the objectives of the study. The data are interpreted in the Fifth chapter.

In the sixth chapter, the conclusions are made and the followers practical suggestions are made accordingly. Subjects should be divided in to parts as suitable for the external and internal assessment. Simple and useful techniques should be used to report the results of assessments. Curriculum should be oriented at the practical level as necessary. These suggestions should be in implemented at the national level. There are also some suggestions that can be implemented at the school level. They are as follows.

- The teachers with opportunities for training.
- Provide feed back to implement assessment techniques recommended by this study or the development of the students' skills since the teachers are highly concerned with the written test.
- Formulate school monitoring boards so that the teachers can work with stress-free mentality.

University of Colombo Library Sri Lanka